

සැබෑ දෙවිඳුන

# සැබෑ දෙව්දූන

ජීවිතය මට ඉතා උතුම් විය. වෛද්‍යවරයා මාගෙ ශ්වසනාලයේ ගෙඩියක් වැඩීම කරණකොටගෙන, මට ජීවත් වීමට ඇත්තේ කෙටිකාලයක් කියා පවසනා තුරා බිරිඳ, දරුවන් දෙදෙන සහා මම, ඉදිරිකාලය පිළිබඳ ඉමහත් බලාපොරොත්තු ගොණුකරගෙන සිටිමුව. මට දීර්ඝායුෂ ලැබීමට ඇති එකම ක්‍රමය නම්, එය ශල්‍යකර්ම මාලාවක් කොට ස්වරාලය සමග ඉවත්කිරීමය. එම උග්‍රඅවස්ථාව මාගේ ජීවිතය ප්‍රබල විරාමයකට ගෙන ආවේය.



බොහෝ වාණු පරීක්ෂණයන් පසු, මා පළමුවෙනි ශල්‍යකර්මයට මුහුණ දුන්නෙමි. එය පැයකට සීමා වුවත්, මුළු දවසම එය උදෙසා ගතවිය. එම අත්දැකීමේ වේදනාව දරාගැරීමට නොහැකි තරම් විය. මට සිහි ආවිට, මගේ උගුර කපා 'වාහිනී නලයක්' ඇතුළත් කර තිබෙන බව මා දැනගත්තෙමි. මට කථා කිරීමට හැකිවුයේ මෙම නාලයේ විවරය තුලට මාපටඟිල්ල තැබීමෙන් පමණි.



එක සන්ද්‍යාවක, ශල්‍යකර්මය (සාර්ථක බව පැවැසූ) කර දින 10කට පසු, මගේ මුඛය ලේ



වලින් පිරෙන්නට විය. සැනෙකින් මා හෙදියට කථා කෙළෙමි.  උමතුවෙන් මෙන් බොහෝ වෛද්‍යවරුන්, පැය 3ක කාලයක් තුළ පැවති ලේ වමනය කිරීම නතර කිරීමට වෑයම් දැරීය. 'අපට හැකි සෑම දෙයක්ම කෙළෙමු,' යයි වෛද්‍යවරයා බලාපොරොත්තු රහිතව පැවසීය. මරණාසන්න බව දැන, අන්ත අසරණව 'ස්වාමිවූ යේසුනි මට උපකාර කරන්න,' කියා මා මොරගැසුවෙමි. විගසින්ම ලේ ගැලීම නතර විය.

යේසුස්! යන නාමය කරණකොටගෙන එය සිදුවිය.



මන්ද? මෙම ශල්‍යකර්මය කිරීමට මොහොතකට පෙර සිදුවූ දේ මා ඔබට පහදන්නම්.

මෙම ශල්‍යකර්මය කිරීමට පෙර මට මහත් හියක් දැණින, මාගේ සභාවට ගොස් සැනසිල්ලක් සෙවීමට මා තිරණය කරගත්තෙමි.  මා ජීවිත කාලය පුරාම සිතාගෙන සිටියේ, යේසුතුමන්ගේ මව, මරියා දෙවියන්වහන්සේ සහා මනුෂ්‍යා අතරේ මැදහත්කරන්නා කියාය. එලෙසම අසීරු අවස්ථාවන්වලදී මා යාඥා කළ, ප්‍රියතම 'ශුද්ධවරයෙක්ද' මට සිටින.  එබැවින්, එම ඉරුදින මා මගේ මුළු ශක්තියෙන් යාඥා කලද, මාව අධෛර්යමත්

කරමින්, මා ඇතුල්වූ ආකාරයෙන්ම, නැවත මා පිටවිය.

නැවත මා නිවසට පැමිණි අවස්ථාවේදී, මහත් කලකිරීමකින් මාගේ සිත පිරිගියෙහිය; මේ භියෙන් ගැලවෙන්ට කිසිම මාර්ගයක් මට නොවීය. හදිස්සියේම, බද්ධ නිවසක ජනේලයකින් පැමුණුන කිතුණු ගීයකට මාගේ අවධානය යොමුවී, මට එතැන මනුෂ්‍යයාන් අතරට යාමට මට පෙළඹීමක් ඇතිවිය. ඇතුලට ගියපසු හය දෙනෙකුගෙන් පමණ යුත් කුඩා කණ්ඩායමක් ගීතිකාවක් ගයනා කරන




ආකාරය මා දුටුවෙමි. රැස්වීම අවසන් වූ පසු, පාස්ටර්වරයා මට සුභපතා, 'මා ඔබට කුමක් කරම්ද?' යන්නෙන් මගෙන් ප්‍රශ්ණ කළෙහිය. එවිට මා, මාගේ ශල්‍යකර්මයේ බරපතල්කම ඔහුට පවසා මට යාඥා කරණමෙන් ඉල්ලා සිටියෙමි. ඔහු යාඥා කළ පසු, මා මවිත කරමින් ඒ සියලු භිය ක්ෂණයකින් පහවී ගියෙහිය. ඔහු මාව බැහැදැකීමට පැමිනෙණ බවට පොරොන්දු වෙමින්, යේසුතුමන් මට උපකාර කරන බවට සහතිකය දුන්නෙහිය.

සැබවින්ම, මේ සෙනගගේ යාඥාව මාගේ පළමුවෙනි ශල්‍යකර්මය තුළදී මාව ආරක්ෂා කළෙහිය. ඔවුන් මේ පරික්ෂා කාලයේදී, මා හමුවෙන්නට පැමිණ, බයිබලයෙන් යේසුතුමන් ගැන බොහෝ කාරණා උගන්වා දුන්නෝයා. එවිට මාගේ නෙත් විවරවී, දෙවිතුමන් සහා මනුෂ්‍යා අතර

එකම මැදහත්කරුවාණන් යේසුකිතුතුමන් බව මට අවබෝධය විය. ඒ හේතුකොටගෙන මා යාඥාකර, ප්රීතියෙන් යේසුතුමන් මාගේ ස්වාමින්වහන්ස සහ ගැලවුම්කරුවාණන් ලෙස පිළිගෙන, එතුමාණන්ගේ සමාදානය සහ උන්වහන්සේගේ සුහද අභිමුඛයේ සහතිකයද ලබාගත්තෙමි.

පළමුවෙනි ශල්යකර්මයෙන් ප්රකෘතිස්වභාවයට පත්වූ පසු, මාව රෝහලෙන් ටිකට් කපා, සතියකට වරක් චිකිත්සාගාරයට පැමිණෙන ලෙස පවසනු ලැබුවා.



අවසානයේදී, මගේ ආයුෂ දීර්ඝ කරණ පිණිස, තිබූ එකම ක්රමය වූ ස්වරාලය ඉවත් කිරීම සඳහා නැවතත් මට දෙවෙනි ශල්යකර්මයත් කිරීමට සිදුවුවා. ඒ අතරතුරේදී, මාගේ අලුත් මිතුරන් මට බයිබලයෙන්, ‘මම වනාහි නුඹ සුවකරන්නාවූ ස්වාමින්වහන්සේය.’(නික්. 15:26) යන පදය බෙදාගත් අතර, දේව වචනය මාගේ දිවියට නව ජීවිනයක් ගෙන දුන්නෙහිය. ‘ප්රේමවන්තය, නුඹේ ආත්මය සඵලවන්නාක්මෙන්ම නුඹ සියල්ලෙහි සඵලවන ලෙසද සුවසේ සිටින ලෙසද යාඥාකරමි. (3 යොහාන් 2) යන්නාවූ පොරොන්දු දෙකෙන් යේසුතුමන්ට සුවකල හැකි යන සහතිකය මට ලැබිණ. යේසුතුමන් පැවසුවේ, ‘මම මැරුණෙමි, නුමුත් බලව, මම දැන් සදාකාලේටම ජීවත්ව සිටිමි, මරණේද පාතාලයේද යතුරු මට ඇත්තේය: (එළිදරව් 1:18). මාගේ වෛද්යවරුන් කෙරෙහි මා සම්පූර්ණයෙන් විශ්වාස කරත්, දේවවචනය

කෙරෙහි බලාපොරොත්තු තැබීමෙන් මට, යේසුතුමන් කෙරෙහි සහ එතුමන්ගේ වචනය කෙරෙහි මහත් ඇදහිල්ලක් ඇතිවිය.
එක් රාත්රියක, දෙවෙනි ශල්යකර්මය සඳහා මා රෝහලට ගියවිට, මා අසල ඇඳේ සිටි තරුණයා, බඩේ අමාරුවකින් මොරගසන්නට විය. මහත් අනුකම්පාවකින් මගේ හදවත



පිරිගියෙහිය. මම ඔහුගේ ඇඳ අසලට ගොස්, මගේ අත ඔසවා මෙලෙස පැවසීය, 'ස්වාමිවූ යේසුනේ, මේ තරුණයා මහත් වේදනාවෙන් දුක්විඳියි, කාරුණිකව ඔහුට උපකාර කර වේදනාව ඉවත් කරන්න: එකෙනෙහිම ඔහු සම්පූර්ණ සුවය ලබා සිටගත්තෙහිය! ඒ ස්ථානයේදී මා ලැබූ අත්දැකීමෙන් පසු, මම එම ස්ථානයේ, එම මොහොතේම, දෙවෙනි ශල්යකර්මය නොකිරීමට තීරණය කෙළෙමි. සැබවින්ම මෙම තරුණයාව සුවකළ යේසුස්වාහන්සේට මාවද සුවකළ හැක යන්න මා හට ගැගිනි. එම සතියෙම, වෛද්යවරුන්ගේ අවවාදය නොසලකා මා රෝහලෙන් පිටවී ගෙදර ගියෙමි.

ඉන් පසු සතිවලදී, මා රෝහලට නොපැමිණීම ගැන විමසමින් ඔවුන් මට ලිපි තුනක් එවීය. තුන්වන ලිපියේ මාගේ රෝගයේ භයානක බරපතලකමත්, ඔවුන්ගේ



පරීක්ෂණයන් අනුව මා මියයන්නට වුවත් හැකි බවත් සඳහන් කර තිබුණි. තවදුරටත්, මා මියගියහොත් ඔවුන් වගනොකියන බවටත් සඳහන් කර තිබුණි. අවසාන ලිපිය, මේ සියලු දේ ගැන වගකීමකින් කියවන්නට සැලැස්වුවත්, දේව වචනය කියවන්න, කියවන්න තව වැඩි වැඩියෙන් මාගේ සිත සමාදානයෙන් සහා ධෛර්යයෙන් පිරි යන්නට විය.

කාලයකට පසු, ස්වරාලයේ මෙම වැඩිම කරණකොටගෙන, හුස්මගැනීමේදී මහත් වේදනාවක් දරන්නට විය. වෛද්‍යවරුන් පැවැසූ සියලුදේ සිදුවන්නට විය. මගේ සුවකරන්නාවූ තැනැන්වහන්සේ ලෙස කිතුතුමන් මත තැබූ ඇදහිල්ල දැන් පරීක්ෂාවට ලක්වී ඇති බව මට වැටහුනේය.




දිනක් මා යාඥා කරමින් සිටි විට, එක් හඬක් මාගේ නම කියා පැවසුවා, 'ඔබ පැරණි නිවසකට යන්නට පෙර පළමුව කුමක් කරණු ලබනවාද? ඒ ස්වාමින්වහන්සේ බව මා දැන; 'එය මට පිරිසිදු කරන්නට සිදුවෙයි: උන්වන්සේ පහදාදෙමින්, 'මගේ කැමැත්ත ඔබව මගේ මාලිගාව කිරීමටයි; නුමුත් පළමුව ඔබව හොඳින් පිරිසිදු කරණු ලැබිය යුතුයි: යේසුතුමන් මට කමාවදී එතුමන්ගේ දරුවෙකු බවට මා පත්කර තිබෙන බව මා දැනගෙන සිටියෙමි, නුමුත් මගේ පාපය මා මුළුමනින්ම කියා සිට තිබුනේ නැත. මා සයලු පාප සමිදුන්ට කියාසිටි අවස්ථාවේදී මගේ නොවටිනා තත්වය




පිළිබඳව මහත් හැඟීමක් පැමිණ, මට එතුමාගේ ශුද්ධ අබියස, මට පුළුවන් වුයේ හඬන්නට පමණී. මා වෙනුවෙන් යේසුතුමන් කුරුසියේ මිය ගියසේක! යේසුතුමන් මා වෙනුවෙන් කළ දේ පිළිබඳව ගුනවන්තභාවය මගේ හද පත්ලෙන් පිරි ඉතිරි යන්නට විය. යාඥාවෙන් මා නැගිටි විට මා පිරිසිදුකරණු ලැබ, සහනය සහ හුස්මගැනීමට තිබු අසීරුතාවයෙන් සම්පුර්ණයෙන් නිදහස ලැබුවෙමි.

එක් උදැසනක කිසිදිනක අත්නොදුටුසේ හුස්මගැනීමට අසිරුවීමෙන් මා අවදිවීමි. හැම ආශ්වාෂ ප්රශ්වාශ කිරීමක්ම මරණය සහ ජීවිතය අතරවූ පොරබැදීමක් විය. කෙසේ හෝ මා දනින් හිඳ, මගේ සිත් පතුලෙන්, ‘ ස්වාමිවූ යේසුස්වහන්ස ඔබවහන්සේ මා සුවකලහොත්, මා ඔබවහන්සේ වෙනුවෙන් කුමක්හෝ දෙයක් කරන්නේමියි!’ කියා පැවසුවෙමි. උන්වහන්සේ මා සම්පුර්ණයෙන් එතුමාණන්ගේ කැමැත්තට භාරවෙනතුරු බලාසිටි බව පැහැදිලිය. හදිස්සියේම, මා තදින් කහින්නට විය, එවිට අමුතු යම් දෙයක් මගේ කටට වැටින, මා එය මගේ අතට දමා, එය කුමක්ද කියා සෝදිසි කෙරුවෙමි,... එය උගුරේ තිබු ගෙඩියය! අවසානයේදී මා නිදහස් වුවා! දේව වචනය පොරොන්දු කර තිබෙන ලෙසම යේසුතුමන් මා සුවපත් කළසේක. දෙවිතුමන්ට මහිමය අත්වෙවා! පැවසීමට තවත් සාක්ෂියක් ඇත.



නැවත වරක් සාමාන්‍ය ලෙස කෑමට සහා හුස්ම ගැනීමට හැකිවීම කොතරම් ප්‍රීතියක්ද: නුමුත් මගේ උගුරේ තවත් යම් දෙයක් සිරවී තිබිණි, 'ශ්වාසනාලිකා හටයේ' කොටසකි: මා දෙවෙනි ශල්‍යකර්මයටත් පැමිණියේයයි, විශ්වාස කරමින්, වෛද්‍යවරුන් එය ඉවත්කර නැත. ඇතැම් විට එය වේදනාකාරී, හිරිහැරයක් බවට පත්විය, මෙයද, උගුරේ ගෙඩිය මෙන් ඉවත්කරන ලෙස මා දෙවියන්වහන්සේගෙන් උදක්ම ඉල්ලා සිටියෙමි. මා යාඥා කරණ සෑම මොහොතකම එය සෙලෙවී, දැඩි වේදනාවක් ඇතිකර ලේ ගලයි. අවසානයේදී, මා සම්පූර්ණයෙන්ම එය වෙනු යාඥාකිරිම නතරකර ඒ දෙවිතුමාණන්ට, එතුමාණන්ගේ ප්‍රේමය උදෙසා ප්‍රශංසා කිරීමට පටන්ගතිමි.
දිනක්, වෙනස් ආකාර යාඥා කිරීමක් මගේ සිතට පැමුණුනේහිය. මගේ උගුරේ තිබු එම දෙය, ඉවත්කරනවා වෙනුවට, එය දියකරන ලෙස උන්වහන්සේගෙන් මා ඉල්ලා සිටියෙමි. සැබවින්ම, දෙවිතුමන්ද කිරීමට බලාපොරොත්තු වී තිබුණේ එයයි.... එය එතුමාණන් කළසේක! උන්වහන්සේ සම්පූර්ණයෙන්ම එය දිය කලසේක!

වෛද්‍යවරුන් මට ජීවත්වීමට දෙනු ලැබුවේ මාස හයකි, එහෙත් දැන් වර්ෂ ගණනාවක් ගත වී තිබෙන නුමුත්, දේව මහිමයට ස්තුතිවෙන්නට, මම තවමත් පණපිටින් සිටින්නෙමි! පෙනෙන්නට කිසිම කැළලක, සලකුණක්වත් නැත. මා කළ ශාරීරික පරීක්ෂණ සහා X-කිරණ, යේසුතුමන් මාව සම්පූර්ණයෙන් සුවකළ බවට ඔප්පු කරයි! උන්වහන්සේගේ වචනය අනුව වතුර බව්තිස්මයට මා



කීකරු වී, ඉන් අනතුරුව ස්වාමිවූ යේසුස්වහන්ස මා ශුද්ධාත්ම බව්තිස්මයෙන් ආලේප කලසේක. ඒනම් දේවදරුවෙකුට තිබිය යුතු අත්යවශ්ය අත්දැකීම්ය. (කියවන්න මතෙව් 28:19, ක්රියා 2:38). මා නිරතුරුවම දෙවිතුමන්ට විශ්වාශවන්තව සිටින්නෙමි! ස්වාමින්වහන්ස මා සුවකළ මොහොතේ මා කළාවූ පොරොන්දුව පරිදි, මා එතුමාණන්ට සේවය කරමින්, යේසුතතුමන් කළ ප්රතිහාරයන්



පිළිබඳ සැමට ප්රකාශකරමින් සිටින්නෙමි. එතුමාණන් සැබෑවූ දෙවිතුමන්ය! අද දිනම ඔබගේ දිවිය දෙවිතුමන්ට භාර නොකරන්නේ මන්ද? ඔබ රෝගාතුරව සිටිනවානම්, ඔබට අවශ්යතාවයන් තිබෙනවානම්, යේසුතුමන්ට හඬ ගසන්න. ‘නුඹලා විසින් මගේ නාමයෙන් ඉල්ලන කොයි දෙයක් වුවත්,........ මම ඒක ඉෂ්ඨකරන්නෙමි. (යොහාන් 14:14)

“දෙවිතුමන්ට කළහැකි දේ රහසක් නොවෙයි, අන් අයට කළ දේ ඔබටත් කරදෙනවා ඇත!”

’කෙලි එම්. බර්ක්’

